## මගෙන් වචනයක්..

උසස් පෙලට ඔයා මිඩීයා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොඳ ලකුණක් දාන්නම ඔනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පිය-න්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොඳ තැනකට ඒවි කියන බලා-පොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඔනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නෑ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා



Design by - Creativepixel.lk - Search us on fb/insta

දෙවෙනි පාඩම

# සන්නිවේදනයේ පදනම

Foundation of Communication Studies

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටවින්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටවින්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

## සන්නිවේදනයේ කාර්යයන්

1 **තොරතුරු සම්පාදනය / අධ්‍යාපනය**

සෑම සන්දේශයක්ම තොරතුරක් ලෙස සැලකිය හැකිය සෑම සන්නිවේදන අවස්ථාවකදීම තොරතුරු සම්පාදනයක් සිදුවේ
උදා: භාණ්ඩයක මිල පැවසීම ලිපිනයක් ලබා දීම

2 **උපදෙස් සම්පාදනය / අධ්‍යාපනය**

සන්නිවේදනය මගින් තොරතුරු සම්පාදනයක් සිදු වුවද ඉන් ඔබ්බට ගිය ක්‍රියාකාරී ස්වභාවයක් පවතී කරුණු දැක්වීමකට සීමා නොවී කිසියම් සංවිධානත්මක හෝ අර්ථකථනාත්මක ඉදිරිපත් කිරීමක් පෙන්නුම් කරයි

උදා: දේශන වැඩමුළු සම්මන්ත්‍ර

3 **පෙලඹවීම**

සන්දේශ මගින් යමෙකු සිතන පතන ආකාරයේ හෝ කටයුතු කරන ආකාරයේ වෙනසක් සිදු කිරීම් මේ සඳහා කථනය රූපනය ලේඛනය ආදී විවිධ උපක්‍රම භාවිතා කරයි
උදා: වෙළඳ දැන්වීම් ආගමික වැඩසටහන් කෘෂි කාර්මික සන්දේශ

4 **විනෝදාස්වාද සම්පාදනය**

විවේකයෙන් විනෝදයෙන් කාලය ගත කිරීමට සන්නිවේදනය වැදගත් වේ
උදා: සංගීතයට සවන්දීම චිත්‍රපට බැලීම විනෝදාත්මක සංවාද විනෝදාත්මක දේශන

ඊට අමතරව

සුපරීක්ෂණය
අර්ථකථනය
සහසම්බන්ධය
සමාජානුයෝජනය

සන්නිවේදනයෙ කාර්යය වේ

## සන්නිවේදනය හදුනා ගැනීම

තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි

සන්නිවේදනය යන පදයේ පෑථුල අර්ථය දැන ගත් දේ දැන ගැනීමට සැලැස්වීම යන්නයි

ඉංග්‍රිසි භාෂාවේ Communication යන පදය ලතින් භාෂාවේ පොදු බවට පත් කිරීම යන අරුත සහිතය

දෙමල භාෂාවෙන් සන්නිවේදනය තොඩර්පාඩල් යනුවෙන් හදුන්වයි එහි අදහස සබදතා පැවැත්වීමේ ක්‍රියාවලිය යන්නයි

## සන්නිවේදනයේ ස්වභාවය (ගතිලක්ෂණ)

■ **අරමුණක් ඇතිව සන්නිවේදනයේ යෙදෙන බව**

■ **සංකේතාත්මකය**
සංකේත වලින් සමන්විත බව
උදා: සංඥා, ලකුණු, ඉගි, සිතියම්

■ **සන්දර්භානුගතය**
සන්නිවේදනය සිදුවන වට පිටාවයි නැතහොත් පරිසරයයි
උදා: පන්ති කාමරයක්, ආගමික උත්සවයක්, විවාහ මංගල්‍ය උත්සවයක්, ක්‍රීඩා උත්සවයක්

■ **සන්නිවේදනය ක්‍රියාපටිපාටියකි**
කිසියම් නිශ්චිත ක්‍රමවේදයකට / පිළිවෙලකට අනුව සන්නිවේදනය සිදුවේ
උදා: ලිඛිත සන්නිවේදනය සිදුවන පියවර

1. සිතීම
2. සැලසුම් කිරීම
3. ලිවීම
4. සංස්කරණය කිරීම
5. නැවත ලිවීම

■ **සන්නිවේදනය විවිධාකාර වේ**
සන්නිවේදනයේ විවිධ ස්වරූප වර්ග පවතින බව උදා: පුද්ගලාන්තර, කණ්ඩායම්, ශ්‍රව්‍ය, දෘශ්‍ය

■ **සන්නිවේදනය ඒක මාර්ගික මෙන්ම ද්වි මාර්ගික වේ**
තොරතුරු ලබා ගැනීමක් හෝ ලබා දීමක්

■ **සන්නිවේදනය බලය වේ**
පුද්ගලයන් පොළඹවා ගැනීමට ඔවුන්ගේ චර්යාවන් වෙනස් කිරීමට සන්නිවේදනයට හැකියාවක් පවතී

# සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග

01 **සන්නිවේදකයා**
තවත් පාර්ශ්වයක් සමග තොරතුරු අදහස් ආකල්ප ආදිය හුවමාරු කර ගන්නා තැනැත්තායි
සන්නිවේදකයා පුද්ගලයකු පමණක් නොව කණ්ඩායමක් සංවිධානයක් ආයතනයක් විය හැකිය
උදා: නිවේදකයා ගුරුවරයා රූපවාහිනී ආතනයක් ගුවන් විදුලි ආයතනයක්

02 **ආකේතකරණය**
සන්නිවේදකයාගේ සිතේ ඇතිවන අදහස් හැඟීම් තව අයෙකුට සන්නිවේදනය කිරීම සඳහා සංකේත උපයෝගී කර ගනිමින් සන්දේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියවලිය

03 **සන්දේශය**
සන්නිවේදකයා අනෙක් පාර්ශ්වය සමග හුවමාරු කර ගන්නා තොරතුරුයි

04 **නාලිකාව /මාධ්‍ය**
සන්නිවේදක ස්ථානයේ සිට අපේක්ෂිත පාර්ශ්වය වෙත සන්දේශය ගෙන යනු ලබන්නේ
නාලිකාව මගිනි
උදා: පුද්ගලයකුගේ පංචේන්ද්‍රිය පොස්ටර් පත්‍රිකා ලිපි ග්‍රන්ථ පුවත්පත් රූපවාහිනිය ගුවන් විදුලිය

05 **ග්‍රාහකයා**
සන්නිවේදකයා විසින් සිය සන්දේශය හුවමාරු කර ගැනීමේ අපේක්ෂාව ඇතිව එය ඉදිරිපත් කරනු ලබන්නේ කවරකු වෙතද ඔහු ග්‍රාහකයායි
උදා: පාඨකයන් ශ්‍රාවකයන් ප්‍රේක්ෂකයන්

ග්‍රාහකයන් විශාල ප්‍රමාණයක් ග්‍රාහක ක්ෂේත්‍රය ලෙස හදුන්වයි

06 **විකේතකරණය**
සන්නිවේදකයා ඉදිරිපත් කරනු ලබන සන්දේශයේ ඇතුලත් සංඥා සංකේත අක්ෂර රටාවල
අර්ථය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය විකේතකරණය නම් වේ

07 **ප්‍රතිපෝෂණය**
සන්නිවේදකයා සන්දේශයක් ලබා දුන් පසු ග්‍රාහකයා ඒ සම්බන්ධයෙන් සන්නිවේදකයා වෙත ලබා දෙන නිරීක්ෂණය කළ හැකි ආකාරයේ ප්‍රතිචාරයි

08 **ඝෝෂා /බාධා**
සන්නිවේදක ස්ථානයේ සිට ග්‍රාහක ස්ථානය දක්වා සන්දේශයක් සම්ප්‍රේෂණය වීමේදී ඊට
අවහිරවන ලෙස මැදිහත් වන ඕනෑම තත්ත්වයක්
ඝෝෂා /බාධක වේ

ඝෝෂා /බාධා වර්ග කිහිපයකි

මාධ්‍ය බාධක
අර්ථ බාධක
මෙයට අමතරව තවත බාධක වර්ග ගණනාවක් ඇත

**පාරිසරික බාධක, තාක්ෂණික බාධක, ශාරීරික බාධක, මානසික බාධක**

09 **අත්දැකීම් පසුතලය**
පුද්ගලයා සතුව ඇති පූර්ව අත්දැකීම් සමූහය මෙයින් අදහස් වේ

10 **සන්දර්භය**
සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන වටපිටාවයි

11 **බලපෑම**
සන්දේශය තුලින් ග්‍රාහකයා තුළ ඇති කිරීමට
අපේක්ෂිත වෙනස

# සන්නිවේදනය යනු කුමක්ද?

**හැරල්ඩ් ඩී ලැස්වේල්ගේ නිර්වචනය** * **1948**

යම් කිසිවෙකු යම් කිසිවක් කිසියම් නාලිකාවකින් යම් කිසිවෙකුට කිසියම් බලපෑමක් කිරීම
සඳහා ප්‍රකාශ කරනු ලබන දෙය සන්නිවේදනයයි

**ශැනන් සහ වීවර්ගේ නිර්වචනය** * **1949**

සන්නිවේදනය යනු යම් තැනක දී නිර්මාණය කරගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ
ආකාරයෙන්ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීමයි

**විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය** * **1954**

තොරතුරු ගැබ් වූ සංඥාවක් කරණ කෙට ගෙන
දෙපාර්ශ්වයක් අතර එක හා සමාන චිත්ත
ස්වභාවයක් ඇති වීම සන්නිවේදනයයි

**චාල්ස් එච් කූලිගේ නිර්වචනය**

මානව සම්බන්ධතා රදවා සිටින්නාවූත් වර්ධනය කරන්නා වූත්වූ සියලු සංකේත මෙන්ම ඒවා
දේශයෙන් දේශයට ප්‍රවාහණය කිරීමටත් කාලයේ බැදුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කර
ගැනීමටත් උපකාරී වන උපක්‍රම සන්නිවේදනයයි

**ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ නිර්වචනය**

අදහස දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මගින් ප්‍රදානය කිරීම ප්‍රකාශ කිරීම
හෝ හුවමාරු කර ගැනීම සන්නිවේදනයයි